# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

## "ලුණුගම්වෙහෙර" හි යෝජිත ගැටලුකාරී වන අලි පුනරුත්ථාපන මධ්‍යස්ථානය (PERC) සඳහා කිලෝමීටර් 30 ක් දිගැති අධිශක්ති වැටක් ඉදිකිරීම සඳහා ලංසු

**කොන්ත්‍රාත් අංකය : LK-ESCAMP-DWC-68850-CW-RFB**
**ණය අංකය : 5792-LK**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පරිසර පද්ධති හා කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) හි, පිරිවැය අරභයා, ලෝක බැංකුව වෙතින් ණය මුදලක් ලැබී ඇති අතර, එකී ණය මුදලේ ලැබීම් වලින් කොටසක් "ලුණුගම්වෙහෙර" හි, යෝජිත ගැටලුකාරී වන අලි පුනරුත්ථාපන මධ්‍යස්ථානය (PERC) සඳහා කිලෝමීටර් 30 ක් වන දිගක් සඳහා අධිශක්ති විදුලි වැටක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ එන යෝග්‍ය ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කෙරේ.

02. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ, (MMDE) හි, පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) වෙනුවෙන්, ස්ථාවර කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) හි සභාපති විසින් (වැට්බදු හැර) රුපියල් මිලියන 862 කට පිරිවැය ඇස්තමේන්තුගත කර ඇති (ආසන්න වශයෙන්) සහ පහත විස්තර කර ඇති පරිදි වන, "ලුණුගම්වෙහෙර" හි, යෝජිත ගැටලුකාරී හස්ති පුනරුත්ථාපන මධ්‍යස්ථානය සඳහා කිලෝ මීටර් 30 ක් දිගැති, අධි ශක්ති වැටක් ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

කාර්ය කර්තව්‍යයනට, හස්තීන් සඳහා රැඳවුම් අධි ශක්ති වැටක් සඳහා පෙරසවි / වාත්තු කළ, ආසන්න වශයෙන් පෙර සවි කොන්ක්‍රීට් පෙර සවි කුලුනු 5400 ක් සකස් කිරීම, සැපයීම, ප්‍රයිමර් ආවරණ ආලේප ඒකක පිත්තාරුවක් සහ කාලගුණ ආවරණ ආලේප, (වෙදර්ෂීල්ඩ්), ආලේප පිත්තාරු දෙකක්, යොද කුලුනු පින්තාරු කිරීම, කොන්ක්‍රීට් කුලුනු කණු ඉදිකිරීම සඳහා අත්තිවාරම සෑදීම සඳහා හෑරීම සහ අත්තිවාරම දැමීම, කිලෝමීටර් 30ක දිගකට සීමා නිර්ණය කළ සීමාව දිගේ කොන්ක්‍රීට් කණු / කුලුනු ඉදිකිරීම හා ස්ථාපනය කිරීම / සවි කිරීම, කොන්ක්‍රීට් කුලුනු වලට පේළි හතකින් (7) කින් යුත් අධි බල අධි ශක්ති රැහැන් ස්ථාපනය කිරීම / සවිකිරීම යනාදිය අන්තර්ගතය. ඉදිකිරීම් කාල සීමාව ආසන්න වශයෙන් මාස 24 ක් වනු ඇත.

03. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ පැවැත්වේ.

04. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, පහත සඳහන් සුදුසුකම් හා යෝග්‍යතා නිර්ණායක සපුරාලිය යුතුය.

* ලංසුකරු ගොඩනැගිලි හෝ මහාමාර්ග විශේෂඥතාවය සහිතව, C - 1 හෝ ඊට ඉහළ ශ්‍රේණි සඳහා CIDA (කලින් ICTAD) හි, ලියාපදිංචි වී සිටිය යුතුය.
* පසුගිය වසර පහ (05) තුළ ඉටුකරන ලද, ඉදිකිරීම් කාර්යයන්හි, වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍ය අගය, අඩුම තරමින් රුපියල් මිලියන, 650 ක් වත් විය යුතුය. (ලංසු විවෘත කරනු ලබන දිනය දක්වා).
* මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදුකරන ලද යම් අත්තිකාරම් ගෙවීම් වෙතොත් ඒ හැර, ද්‍රව්‍යශීලී වත්කම් සහ/හෝ ව්‍යාපෘති විශේෂිත ණය පහසුකම් වල අවම අගය රුපියල් මිලියන 110 කට නොඅඩු විය යුතුය.

05. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු විස්තර, බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ, අංක 82 හි, "සම්පත්පායේ", පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) හි, ප්‍රසම්පාදන අංශයෙන් (දුරකථන අංක : 011-2888426, 011-2888427) මගින් විමසා ලබා ගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන, 2019.03.08 වන දින දක්වා රාජකාරී දින වලදී පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී ඉහත කී ලිපිනයෙන් ගාස්තු ගෙවීමකින් තොරව නොමිලේ පරීක්ෂාකර බැලිය හැකිය.

06. අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 82 හි, 'සම්පත්පායේ" පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) හි, ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ලිඛිත අයදුම්පතක් CIDA (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ) ලියාපදිංචි සහතිකයේ පිටපතක් ද සමග ඉදිරිපත් කිරීමෙන් හා ආපසු ගෙවනු නොලබන රුපියල් 80,000/- ක් (රුපියල් අසූ දහසක් වන) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2019.01.28 වන දින සිට 2019.03.08 වන දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා මිලදී මිලදීගත හැකිය.

07. ගෙවීමේ ක්‍රමවේදය මුදලින් ESCAMPහි (පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ) හි, ව්‍යාපෘති ගණකාධිකාරී වෙත මුදලින් ගෙවීම වනු ඇත.

08. අනු පිටපතකින් යුක්තව අංගසම්පූර්ණ කරන ලද ලංසු "මුල් පිටපත" හා "අනු පිටපත" යනුවෙන් ලකුණු කර වෙන වෙනම කවර වල බහා මුද්‍රා තබා නැවත එම කවර දෙකම එක් තනි කවරයක බහා එම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කොන්ත්‍රාත්තු අංකය හා ඉදිකිරීම් කර්මාන්තයේ ශීර්ෂ නාමය**" පැහැදිලිව සටහන් කර, 2019.03.11 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර, ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

09. ලංසු 2019.03.11 වන දින ප.ව. 2.00 ට හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500 හි, 8 වන මහලේ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ, තාක්ෂණ සේවා අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැකිය. ප්‍රමාද ලංසු භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු එම ලංසු භාරගන්නා වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

10. ලංසු 2019.06.12 වන දින දක්වා වලංගු විය යුතුය.

11. සියලුම ලංසු සමග 2019.10.07 වන දින දක්වා වලංගු සහ රුපියල් මිලියන දහයක් (රු. 10,000,000) ක් වන වටිනාකමින් යුත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද ලංසු සුරක්‍ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

12. වලංගු ලංසු සුරක්ෂණ රහිතව ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලංසුවක් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. පූර්ව ලංසු රැස්වීමක්, 2019.02.11 වන දින පෙ.ව. 10.30 ට ආරම්භව, කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500 හි, 8 වන මහලේ, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ තාක්ෂණ සේවා අංශයේදී පැවැත්වේ.

**ඉහත සඳහන් ලිපිනය වනුයේ,**

**සභාපති,**
**ස්ථාවර, කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව (SCAPC),**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,**
**8 වන මහල, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**